# යුරෝපා ඉතිහාසය

## 5.1.6
## කාර්මික විප්ලවයේ ප්‍රතිඵල



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

## සමාජීය ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්

කාර්මික විප්ලවයේ වැදගත් සමාජීය ප්‍රතිඵලයක් ලෙස නගර බිහිවීම දැක්විය හැකි ය. නගරවල ජීවත් වූ ජනතාවගේ ජීවන තත්ත්වය ද පුළුල් වෙනසකට භාජනය විය. කර්මාන්ත ශාලා විශාල වශයෙන් භාණ්ඩ නිෂ්පාදන කළ අතර ඒවා දැරිය හැකි මිලකට ජනතාවට ලබාගත හැකි විය.

විවිධ රැකියා අවස්ථා බිහිවීම ද කාර්මික විප්ලවයේ සමාජීය ප්‍රතිඵලයකි . විවිධ රැකියා බිහිවීම ද ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමට හේතුවක් විය.

**සමාජීය වෙනස්කම්**

* නගර බිහි වීම හා නාගරීකරණය
* පන්ති භේදය
* අපචාර ක්‍රියා බහුල වීම
* පරිසර දූෂණය
* ශ්‍රමය හා ධනය දැතකට යාම



කාර්මීකරණයේ තවත් ප්‍රතිඵලයකි කාර්මික නගර බිහිවීම. නගර කරා වේගයෙන් ජනතාව ඇදී ඒම නිසා ජනගහනය එම නගරවලට ඔරොත්තු නොදෙන තරම් විය. කර්මාන්ත බිහිවීමෙන් රැකියා බහුල වීම මෙසේ නාගරීකරණය වේගවත් වීමට හේතුවක් විය. මෙසේ නාගරීකරණය වේගවත් වූවත් නගරවල පහසුකම් වර්ධනය වුයේ ඉතා හෙමිහිට ය.





පන්ති සහිත සමාජයක් බිහිවීම ද කාර්මික විප්ලවයේ තවත් ප්‍රතිඵලයකි. විසිවන සියවස වන විට යුරෝපයේ සෑම රටක ම වගේ ආර්ථික කටයුතු මෙහෙය වනු ලැබුවේ මෙසේ බිහි වූ ධනපති පන්තිය විසිනි. ව්‍යාපාර කටයුතුවල යෙදුණු අය වෛද්‍යවරු ඉංජිනේරු වැනි ඉහළ වෘත්තීන්වල යෙදෙන්නන් ධනපති පන්තියේ සාමාජිකයින් විය. ඔවුන්ට විවිධ ආර්ථික කටයුතුවලින් විශාල ආදායමක් උපයාගත හැකි විය. ඉන් වඩාත් උසස් ජීවන මට්ටමක් හිමි කර ගැනීමට හැකි විය. කම්කරු පන්තිය සමස්තයක් ලෙස උපයාගනු ලැබුවේ අඩු ආදායමකි. ඔවුන්ගේ ජීවන මට්ටම පහත් විය. මේ අනුව සමාජයේ ධනපති හා නිර්ධන ලෙස පන්ති දෙකක් බිහි විය.

කම්කරුවන්ගේ සමාජ පසුබිම ජීවන තත්ත්වය බෙහෙවින් ම අහිතකර මට්ටමක විය. පවුලේ සියලු දෙනාට ම රැකියාවක නිරත වීමට සිදු විය. දිනකට පැය දොළහකටත් වඩා සේවය කිරීමට සිදුවිය. ඔවුන්ගේ වාසස්ථාන වුයේ මුඩුක්කු හා පැල්පත් ය. එම නිවාසවල අවම සනීපාරක්ෂක පහසුම්වත් තිබුණේ නැත. කුඩා නිවසක නැතිනම් කාමරයක පවුලේ සියලු සාමාජිකයන් ජීවත් විය. ඔවුන්ගේ ජීවන මට්ටම බෙහෙවින් ම පහත් මට්ටමක තිබිණි. මෙවැනි පසුබිමක විවිධ අපචාර ක්‍රියා ද බහුල විය.




අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ජී. ජී. තිළිණි නිමේෂා මෙනවිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017/2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

කාර්මික විප්ලවයේ තවත් අහිතකර පැතිකඩක් වුයේ පරිසර දූෂණය යි. කර්මාන්තශාලාවලින් බැහැර කළ අපද්‍රව්‍ය ගොඩබිම, ගංගා , ඇළදොළට මුදා හැරීම සිදු විය. කම්හල්වලින් නිකුත් වූ විෂ ද්‍රව්‍ය වායුගෝලය අපිරිසිදු කිරීමට සමත් විය.







කර්මාන්තශාලාවලින් නිකුත් වූ ඝෝෂාකාරී ශබ්දයන් අධිවේගී සංගීත නාද රටාවන් නිසා ශබ්ද දූෂණය සිදුවුන අතර එය මිනිසුන්ගේ හා සතුන්ගේ පවා සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට බලපෑ ප්‍රබල හේතුවක් විය.

## ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්

කාර්මික විප්ලවයත් සමග ආර්ථිකයේ ඇති වූ තරගකාරි බව නිසා නිෂ්පාදන ශීඝ්‍රයෙන් වැඩි විය. කාර්මික විප්ලවයට පෙර පැවති ශ්‍රේණි ක්‍රමය අනුව නිෂ්පාදන ඒකාධිකාරි ස්වරූපය බිදවැටි නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකයක් වර්ධනය විය. මෙය කාර්මික විප්ලවය නිසා ඇති වූ ප්‍රධානමතම ආර්ථික වෙනසකි.පෞද්ගලික අංශ වේගයෙන් ප්‍රසාරණය විය. පැවැති වැඩවසම් ක්‍රමය බිදවැටි ධනවාදී ආර්ථික රටාවක් වර්ධනය විය. එසේම පෞද්ගලික අංශය ප්‍රසාරණය විය. නිෂ්පාදන වියදම අඩු වූ බැවින් භාණ්ඩ හා සේවා මිල ද අඩු විය. ලෝක වෙළෙඳ පොළට ඉතා අඩු මිලට භාණ්ඩ සැපයීමට හැකි විය . ලෝකයේ කර්මාන්තශාලාව ලෙස බ්‍රිතාන්‍යය හඳුන්වා දීම ද සිදු විය.




වෙළෙඳ හා වාණිජ කටයුතු ආර්ථික ක්ෂේත්‍රයේ පෙරමුණට ම පැමිණීම කාර්මික විප්ලවයේ වැදගත් ආර්ථික වෙනසකි. ඒ අනුව කම්හල් හිමි ධනපති පන්තියක් හා වෙළෙඳ පන්තියක් ද ක්‍රමයෙන් වර්ධනය විය. එසේම ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටී වැටුපට වැඩකරන කම්කරු පන්තියක් ද බිහි විය.

කෘෂි ආර්ථික රටාව බිඳ වැටී ආනයන අපනයන ආර්ථික රටාවක් වර්ධනය වී ඉදිරියට ආවේ ය. කෘෂි නිෂ්පාදන කටයුතු කාර්මීකරණය වී ලෝකය පුර රටවල් අතර භාණ්ඩ හුවමාරුව සිදුවිය. එසේම ධනවාදී ආර්ථික රටාව ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත විය.



අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ජී. ජී. තිළිණි නිමේෂා මෙනවිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017/2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ඉතා වේගයෙන් වර්ධනය වූ නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා ව්‍යවසායකයන් කීප දෙනෙකු එකතු වී සංවිධාන පිහිටුවා ගන්න ලදී. මෙසේ පිහිටුවා ගන්නා ලද සමාගම් පසුකාලීනව බහු ජාතික සමාගම් බවට පත්විය. මෙම සමාගම් භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය බෙදාහැරීමේ ක්‍රියාවලියේ මෙන් ම බැංකු කටයුතු ක්ෂේත්‍රයේ ද කටයුතු කරනු දක්නට ලැබුණි.





## දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ බලපෑම්

කාර්මික විප්ලවය දේශපාලන ක්ෂේත්‍රය කෙරෙහි ද යම් බලපෑමක් ඇති කරන ලදී. කම්හල් හිමියන් හා කම්කරුවන් අතර ඇති වූ නිරන්තර ගැටුම් සේවක වැඩවර්ජන ඇතිවීමටත් වෘත්තිය සමිති බිහිවීමටත් අයිතිවාසිකම් සඳහා සටන් ඇතිවීමටත් හේතුවක් විය. කම්හල් හිමියන් සැමවිට ම උත්සහා කළේ ශ්‍රමය අඩු මිලට ගැනීමට ය. එය කම්කරුවන්ට අයහපත් ලෙස බලපාන ලදී. ඔවුන්ගේ අදායම අඩු වීමත් එමගින් ඔවුන්ගේ ජීවන තත්වය පහත වැටීමත් සිදුවිය. මෙම පීඩාකාරී තත්ත්වයන්ගෙන් මිදීමට ඔවුන් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. සමහර අවස්ථාවල දී රජයට මැදිහත් වීමට ද සිදු වූ අවස්ථා ඇති විය.





ඇඩම් ස්මිත්

ධනවත් හා නිර්ධන පන්ති බිහි වීම සිදු විය. ධනවතුන් ශ්‍රමය මුදලට ගැනීම සිදුවිය. කම්කරුවන්ගේ තත්වය ඉතා පහල මට්ටමකට වැටුණු අතර ඉන් මිදීමට ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග නිසා විවිධ දේශපාලන දර්ශන බිහිවිය. සමාජවාදී, ලිබරල්වාදී දේශපාලන දර්ශනයන් බිහි විය.

කම්කරුවන් ද තම අයිතිවාසිකම් ඉල්ලා උද්ඝෝෂණය කරන ලදී. ඇඩම් ස්මිත් ධනවාදය ව්‍යාප්ත වීමට පදනම් වූ රාජ්‍ය නිර්බාධවාදය නම් සංකල්පය ඉදිරිපත් කරනු ලැබී ය. රාජ්‍ය නිර්බාධවාදය ලෙස හඳුන්වන්නේ ආර්ථික කටයුතු සඳහා රජය මැදිහත් වීම අවම වීමත් පෞද්ගලික අංශය දිරිමත් කිරීමේ ක්‍රියාවලියකි.

කාර්මික සංවර්ධනය වේගවත් වීමත් සමග කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය අඩු මිලට ලබාගැනීමත් නිෂ්පනදන වැඩි මිලට විකුණා ගැනීමත් අවශ්‍ය විය. ඒ සඳහා යටත් විජිතවල දේශපාලන ආධිපත්‍ය පූර්ණව ලබාගැනීම අත්‍යවශ්‍ය විය. 1850 වර්ෂයට පසුව ඇති වූ මෙම අධිරාජ්‍යවාදය නව අධිරාජ්‍යවාදය ලෙස හඳුන්වයි. යුරෝපා රටවල් තම අධිරාජ්‍යන් පුළුල් කර ගැනීමට යාම ලෝක යුද්ධයක් ඇති වීමට ද පවා හේතුවක් විය.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ජ්. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ජී. ජී. තිළිණි නිමේෂා මෙනවිය. ජාතික තරුණ සේවා සභාව. ( 2017/2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk